# භාෂා ප්‍රශ්නය

# ජාතිවාදය

සහ

# ඉදිරි මාවත

ලෙස්ලි ගුණවර්ධන විසිනි.

1958 ඔක්තෝබර්. -/10

# භාෂා ප්‍රශ්නය ජාති වාදය

සහ

# ඉදිරි මාවත

——)○(——

1958 මැයි මස අන්තයේදී ඇතිවූ ජාතිවාදී කලබල ශිෂ්ඨ සම්පන්නවූ හැම දෙනාගේම හැඟීම් දෙදරුම් කවන ලද්දක් විය. ඇතැම් මිනිසුන් තිරිසනුන් මෙන් හැසිරිණි. ඇතිවූ කලබලද ඇතැම් විට 1915 ඇතිවූ සිංහල – මුස්ලිම් කැරළි වලටත් වඩා භයානකය. වැරදි කළවුන් පමණක් නොව, අහිංසකයින් දහස් ගණනක්ද හදිසි තත්ත්වය යටතේ වධ බන්ධනවලට ලක්විය. මේ කාලය තුළවූ දේවල් කරන කොට ගෙන සිංහල දෙමළ ජාතිකයන් බොහෝ දෙනකු අතර ඇතිවූ සිත් වේදනාවන් දිඝී කාලයකට නොමැකී පවතිනු ඇත. සිංහලුන් හා දෙමලුන් අතර භේදය තවත් පළල් වී ඇත. රට දෙකඩ බෙදීමේ අනතුරක්ද පැමිණ ඇත. මේ අවධියේදී, සිංහළ හෝ වේවා දෙමළ හෝ වේවා සෑම ලාංකිකයකුගේම යුතුකම වනුයේ රට විනාශයෙන් බේරා ඉදිරියට ගමන් කළ හැකි මාවතක් සෙවීමට සිත් යොමු කිරීමය.

ජාතිවාදී මාර්ගයේ ගමන් කිරීම නිසා ඉහතකී අවාසනාවන්ත සිදුවීම් ඇතිවන්නේ යැයි ලංකා සමසමාජ පක්ෂය කලින් අනතුරු හැඟවීමක් කළ බව අප, අද සිහිකරනුයේ සතුටින් නොවේ.

එක්සත් ජාතික පක්ෂයේ පරාජයටත් පෙර, 1955 දී, සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීමේ ප්‍රතිපත්තිය නිසා ජාතිභේද කෝලාහල ඇතිවීමට ඉඩ තිබේ යැයි ලංකා සමසමාජ පක්ෂය පෙන්නුම් කර දුන්හ. ඉන්දියාවේ හින්දුවරුන් සහ මුස්ලිම් වරුන් අතර ඇතිවූ ජාතිභේද කෝලාහල රට නිදසුන් වශයෙන් ඉදිරිපත් කරමින් එවැනි කෝලාහලවල කෲරතරකම ගැන අපි කියා දුන්නෙමු. එරටේ හින්දු වැඩි කොටස මුස්ලිම් සුළු කොටසක ගේ සැක බිය සන්සිඳවීමට අසමත් වීම කරන කොට ගෙන අවසානයේදී ඉන්දියාව හින්දුස්ථානය හා පකිස්ථානය වශයෙන් දෙකඩ බෙදීමට සිදුවූ බැව් අපි පෙන්නුම් කර දුනිමු. අප කුඩා රටද එවැනි මාවතක ගමන් කිරීමේ අනතුරු ඇඟවීමද අප කළෙමු. අපි රටේ අළුත් සිංහළ වීරයන්ගේ ජාතිවාදී ප්‍රතිපත්ති වල අවසාන ප්‍රතිඵලය වන්නේ ලාංකික ජාතියේ මෙන්ම සිංහළ ජාතියේද විනාශය බැව් අපි ප්‍රකාශ කෙළෙමු.

ලංකා සමසමාජ පක්ෂයේ අඳුරු අනාවැකියේ ප්‍රථම කොටස දැන් ඉටුවී අවසානය. අප දේශපාලන විරුද්ධවාදීන් පවා අද මෙය පිළිගනිති. **එම අනාවැකියේ දෙවෙනි කොටස ඉටුවෙන තුරු අප බලා සිටින්නෙමුද? නො එසේනම්, එම විනාශයෙන් බේරීමට කල්පනාකාරීව සිත් යොමු කරන්නෙමුද?**

## මූලික ප්‍රශ්නය ජාති භේදයයි

අප එසේ කල්පනා කරන්නේ නම් රාජ්‍ය භාෂා ප්‍රශ්නය එතාගී එයට වඩා මූලිකවූ ප්‍රශ්නයක ස්වරූපයක් පමණක් බව අපට පෙනී යනවා ඇත. එනම් සිංහල – දෙමළ ජාති වාදයේ ප්‍රශ්නයයි. මෙය අළුත් ප්‍රශ්නයක් නොවේ. සිංහල ජාති වාදය මෙන්ම, දෙමළ ජාතිවාදයද කලක සිට පවතින්නකි. ඇත්තෙන්ම, මෑත කාලයක් වන තුරුම සිංහලුන් අතරට වඩා දෙමලුන් අතර ජාති වාදය බලපෑවේ යයි කිව හැක.

එහෙත්, එය එතරම් භයානක දෙයක් නොවීය. එක් අතකින් දෙමළ ජනයා සුළු ජාතියක් වීම නිසා ඔවුන් තුළ එවැනි අදහස් ඇතිවීම පුදුමයක් නොවේ. මක්නිසාද සුළු කොටසකගේ බිය සැක නිසා ඔවුන් එකතුවී ක්‍රියා කිරීමට තැත් කිරීම ස්වභාවික දෙයකි. කුල වශයෙන් බෙදී සිටින සිංහල ජනයා දෙස බලන විටද අපට දක්නට ඇත්තේ එම දර්ශනය මය. මහා කුලය අතර කුල වාදය අඩුවන අතර සුළු කුල අතර එය වඩාත් බලවත් ලෙස පෙනෙන්නට තිබේ.

එහෙත්, මෑත කාලයක පටන් ලංකාවේ අපට දක්නට ලැබුණු දර්ශනය මහා ජාතිය හෙවත් සිංහල ජාතිය අතර ජාතිවාදය සීඝ්‍රව දියුණු වීමකි. මෙය මුලු සමාජයටම තදින් බලපාන්නක් වී තිබේ. රටක් තුළ වෙසෙන සුළු ජාතියක ජාති වාදයට වඩා මහා ජාතියේ ජාතිවාදය භයානක එකක් බව ඉන්දියාවේ අගමැති නේරු තුමා ප්‍රකාශ කළේ නොබෝ දාය. මෙහි ගැඹුරු සත්‍යයක් ඇත. මක්නිසාද සුළු ජාතියේ ජාතිවාදය රට තුළ ක්‍රියාවේ යෙදවීමට සුළු ජාතියට බලයක් නොමැති වන අතර මහ ජාතියේ ජාති වාදය සාර්ථක ලෙස රට පුරා ක්‍රියාවේ යෙදවීමට මහ ජාතියට බලය තිබෙන හෙයිනි. එබැවින්, මහා ජාතියේ ජාතිවාදය කාරණ කොට ගෙන රටක භයානක ප්‍රතිඵල ඇතිවීමට ඉඩ තිබේ.

මෑත කාලයක පටන් සිංහල ජාතිවාදය මේ අන්දමට දියුණුවීමට හේතූන් කුමක්දැයි සොයා බලමු.

## ආණ්ඩුවේ වගකීම

මහජන එක්සත් පෙරමුණේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියත්, ක්‍රියාවනුත්, ප්‍රකාශයනුත්, සිංහල ජාතිවාදය ඇවිස්සීමට ආධාරවූ බැව් සැක නැත. තම අදහස ක්‍රියාවේ යෙදවීමට බලයක් නොමැති විරුඬ පක්ෂවල අයගේ ප්‍රකාශයන් සියයකට වඩා ආංඩුවේ එක ඇමතිවරයකුගේ ප්‍රකාශයක් ජනතාව අතර බලපාමින් බලාපොරොත්තු රැසක් ඇතිකර වන බව සිහියට නොගත් ඇමතිවරු දෙමළ ජනයාට විරුඬව සිංහල ජාතිවාදීන් ප්‍රසිඬියේම ඇවිස්සීමට ක්‍රියා කළහ. මෙසේ ක්‍රියා කිරීමෙන්, රක්ෂා නැතිකම, බඩු මිළ ඉහළ යාම, ශෙවල් හිඟය ආදී ජනතා ප්‍රශ්න

ජනතාවට අමතක කරවා, සිංහල ජාතිවාදය උඩ පළාත් පාලන මැතිවරණ වලදී ඡන්දය ලබා ගැනීමටත්, මේ ආංඩුවේ ජනප්‍රසාදය තාවකාලිකව රැක ගැනීමටත් ඔවුන් කල්පනා කළා වන්නට පුළුවනි. එහෙත් මේ සියල්ලකගේම ප්‍රතිඵලය වූයේ සිංහල ජාතිවාදීන්ගේ ව්‍යාපාරවලට ආංඩුවේ සහය තිබේය සහ එමනිසා දෙමළ විරෝධී සටනකට පොලීසියෙන් අවහිරයක් ඇති නොවන්නේය යන හැඟීම ජනයා තුළ ඇති වීමෙන් ජාතිවාදී කෝලාහල පහසුවෙන් ඇති කළ හැකි පරිසරයක් බිහිවීමය. නොබෝදා සිදුවූ කෝලාහල ඇති කිරීමේ ප්‍රධාන වැරදි කරුවන් ඇම්. ඊ. පිය නොවෙතත් එවැනි කෝලාහල ඇතිවිය හැකි තත්ත්වයක් සූදානම් කිරීමේ වගකීම පැහැදිළිවම ඇම්. ඊ. පියත්, එම ආංඩුවත් මත පැවරේ.

එහෙත්, ඇම්. ඊ. පිය කෙරෙහි ඉහතකී වගකීම පැවරීමෙන් ප්‍රශ්නය නිරාකරනය නොවේ. දුර දිග නොබලන හා තමන් සතු බලය හා නිලතල තාවකාලිකව භුක්ති විඳීමේ චේතනාවෙන් යුතුව වග කීමෙන් තොරව ක්‍රියා කරන පක්ෂයකට—එය ඇම්. ඊ. පිය හෝ වේවා යූ. ඇන්. පිය හෝ වේවා ජාතිවාදය දඩමීමා කර ගැනීමට ඉදිරිපත් වීමට පුලුවන. එහෙත් වැදගත් ප්‍රශ්නය වනුයේ ජනයා එයට සහාය දක්වන්නේ මන්ද යන්නය. දෙමළ ජනයා අතරද, විශෙෂයෙන් සිංහල ජනයා අතරද ජාතිවාදය මේ කාලය තුළ වැඩිවීමට මූලික හේතුව කුමක්ද? එක් අතකින් ඇම්. ඊ. පිය හා යූ ඇන්. පිය ජාතිවාදී ප්‍රචාරයන්වත්, අනික් අතින් පෙඩරල් පක්ෂයේ ජාතිවාදී ආයාචනයන් වත්, නොබෝදා ඇතිවූ උණුසුම් ජාතිවාදයට ප්‍රමාණවත්වූ හේතූන් වශයෙන් දැක්විය නොහැක.

## ලාංකික ජාතික හැඟීම

ලංකාවේ සිංහල ජාතිවාදයත්, දෙමළ ජාතිවාදයත් වැඩිවී සවිටනයවීමට මූලිකවූ හේතූන් දෙකක් තිබේ. ඉන් එකක් නම් ලාංකික ජාතියක් වශයෙන් කල්පනා කිරීමට ජනයා තවමත් ඉගෙන නොගෙන සිටීමය. මෙරට වෙසෙන නා නා වර්ගීය හා ආගමික කොටස් සිංහලුන්, දෙමළුන්, මුස්ලිම් වරුන්, බර්ගර්වරුන් වශයෙන් කල්පනා කිරීමට පුරුදුවී සිටිත නමුදු, එක් රාජ්‍යයක්, එක් රාෂ්ට්‍රයක් තුළ වෙසෙන ලාංකික පුරවැසි පිරිසක් හෙවත් ලාංකික ජාතියක් ලෙස සිතීම තවමත් අ ය. එහෙත්, මෙවැනි හැඟීමක් සියලු කොටස් තුළ ඇති නොකොට ලංකාවට අනාගතයක් නොමැත. වැඩි කොටස වන සිංහලයන්ටත් අනික් සුළු කොටස් වලටත් තම සංස්කෘතිය ආදිය දියුණු කිරීමට සෑම ධෛර්යයක් දෙන අතරම සෑම කොටසක්ම එක මාතෘ භූමියක්වූ ලංකාව තුළ වෙසෙන එක ලාංකික පිරිසක්ය යන හැඟීම ඔවුන් සියල්ලන් තුල ඇති කිරීම අත්‍යාවශ්‍ය වේ.

අතීතයේදී මෙරට පාලනය කළ විදේශිකයින් සවකීය ආත්මාර්ථ කාමී වුවමනාවන් පිරිමැසීම සඳහා මෙරට එක්සත් කළ බැව් නම් ඇත් තකි. එහෙත්, මෙරට ජනතාව අතර ලාංකික හැඟීමක් ඇති කිරීමට ඔවුන් කිසිසේත් ක්‍රියා නොකළහ. සමඟිය ඇති කරනු වෙනුවට ඔවුන්ගේ පරමාර්ථය වූයේ මෙරට වෙසෙන නා නා කොටස් අතර භේදයන් ඇති කර එමඟින් සිය පාලනය ගෙනයාමය. මේ වනාහී ලංකාවේ පමණක්, නොව බටහිර අධිරාජ්‍යවාදීන්ගේ පාලනයට යටවූ අග්නිදිග ආසියාවේ අත්භූත් රටවලද දක්නට ලැබෙන දශීණයකි.

## සටනක් නොමැතිව නිදහස ලැබීමේ ප්‍රතිඵලයක්

ඉන්දියාවේ, බුරුමයේ, මලයාවේ, ඉන්දුනීසියාවේ වෙසෙන නා නා කොටස් ඒ ඒ රට වැසියන් වශයෙන් ජාතික හැඟීම් ඇති කර ගත්තේ බොහෝ දුරට ජාතික නිදහස සඳහා අධිරාජ්‍ය වාදීන්ට විරුඩව කළ සටන් වල බල මහිමයෙනි. ඉන්දියාවේ සිටින නා නා කොටස් අතර ඇති වෙනස් කම් ලංකාවේ සිටින සිංහල සහ දෙමළ ජනයා අතර ඇති වෙනස්කම් වලට වඩා මහත්වේ. එහෙත්, ඔව්හු සියලු දෙනාම ඉන්දියානුන් වශයෙන් කල්පනා කරති.

ලංකාවේ තත්ත්වය නම් මෙයට වෙනස් එකකි. "ලේ බිඳකුදු නොසොල්වා" අපට අපේ නිදහස දිනා ගැනීමට හැකි වූයේ අග්නිදිග ආසියාවේ අනෙක් රටවල ජනයාගේ සටන්වල බල මහිමයෙනි. සටනක් නොමැතිව නිදහස දිනා ගැනීමේ පල විපාක අද අපට විඳින්නට සිදුව තිබේ. සිංහල, දෙමළ, මුස්ලිම් ආදී නා නා කොටස් ජාතික නිදහස් සට නේදී එක්ව දුක් වින්දේ නම් එම පොදු පරිත්‍යාගයේ ප්‍රතිඵලයක් වශයෙන් ලාංකික හැඟීමක් මීට වඩා බොහෝදුරට දියුණුවීම නියතය.

ඉහතකී පාඩුව මෙන්ම තවත් පාඩුවක් අපට විඳින්නට සිදුවේ. යුඩයෙන් පසු මේ රටේ පැවති ආණ්ඩුද ඉහතකී ලාංකික හැඟීම දියුණු කිරීමට කිසිවක් කර නැත. යූ. ඇන්. පී. හා ඇම්. ඊ. පී. ආණ්ඩුව එක් ලාංකික ජාතියක් වෙනුවෙන් ක්‍රියා කිරීමට තබා එසේ කල්පනා කිරීමටවත් අසමත්වී තිබේ. වන්දු වාසි ලබා ගැනීමටත් පීඩිත පංති කඳවුර භේද කිරීමටත් සිංහල, දෙමළ, මුස්ලිම් ආදී භේද ඇවිලවූවා මිස ලාංකික හැඟීමක් දියුණු කිරීමට ඔවුන් ක්‍රියා කලේ නැත. ලාංකික ජාතික පදනමක් උඩ මේ රට එක්සත් කර ඉදිරියට ගමන් කරවීමේ කාර්තව්‍යය, එමනිසා පැහැදිලිව තීම්වන්නේ ධනපති පංතියටත් ධනපති පංතිය රකින පක්‍ෂවලටත් නොව, කම්කරු පංතියටත් එහි පක්‍ෂය වන ලංකා සමසමාජ පක්‍ෂයටත් වේ.

# ආර්ථික ප්‍රශ්නය නොවිසඳීම

ජාතිවාදයේ අමුතු දියුණුවීමට අනික් මූලික හේතුව වනාහි ආර් ථික ප්‍රශ්නයකි. ළදරු මරණයන් අඩුවීම යනාදී හේතූන් රාශියක් නිසා පසුගිය වර්ෂ විසිපහ තුළදී මෙරට ජනගහණය විශාල වශයෙන් වැඩිවී තිබෙන නමුදු ආර්ථික ක්‍රමයේ සෑහෙන දියුණුවක් ඇතිවී නැත. මෙහි අශුභ ප්‍රතිඵල ගණනක් අතුරින් රක්ෂා නැතිකම වැඩිවීම එක් භයානක ප්‍රතිඵලයකි. විශෙෂයෙන් ජ්‍යෙෂ්ඨ සමතුන් ප්‍රධානව තරුණයන්ට රක්ෂාව නොමැතිවීම විශාල ප්‍රශ්නයක් වී තිබේ.

ආර්ථික ප්‍රශ්න නොවිසඳීම කරණ කොට ගෙන වර්ෂ ගණනක් මුලුල්ලේ පැසවමින් තුබූ මහජන කලකිරීම 1953 අගෝස්තු හර්තාලයේදී පිපිරී ගොස් 1956 මැතිවරණයේදී ඉතා පළල් වශයෙන් ප්‍රකාශ විය. මෙම සිදුවීම් දෙකේම තේරුම වූයේ ජනතාව තම මූලික ප්‍රශ්න විසඳීමට අලුත් හැඟීමකින් ඉදිරියට පැමිණි බවය. එම ප්‍රශ්නවලට ප්‍රගතිශීලීවූ පිළියමක් නොමැතිවූ විට, ප්‍රතිගාමී මාර්ගයකින් වත් පිළියමක් සෙවීමට ජනතාව හැරවීමට ඇතැම්විට පුලුවන. පවත්නා සමාජ ක්‍රමය වෙනස් කොට එකී මූලික ප්‍රශ්නයන් විසඳිය හැකි සමාජ ක්‍රමයක් ඇති කිරීමට අසමත්වූ විට, ඔවුනොවුන් එකිනෙකා කාකොටා ගැනීමේ අණතුරක් සමාජය තුළ බිහි වීමට ඉඩකඩ ඇත. හිට්ලර්ගේ පැසිස්ට් ව්‍යාපාරය යටතේ 1933 දී ජර් මනියේද සිදුවූයේ මෙයයි. ආර්ථික අමාරුකම් වලට හේතුවූ ධනපති ක්‍රමය වෙනස් කරනු වෙනුවට, ජර්මන් ජාතිවාදීනට මුළාවූ ජර්මන් ජන තාව එරටේ වෙසෙන සුළු ජාතියක්වූ යුදෙව්වන්ට වධ බන්ධන කිරීමෙන් තම ප්‍රශ්නයන් විසඳිය හැකියයි කල්පනා කළහ.

ලංකාවේද සිදුවී ඇත්තේ මීට බොහෝ වෙනස් නොවූ සිඩියකි. තම ආර්ථික ප්‍රශ්න ගැන හැඟීමක් ලත් සිංහල ජනයාගෙන් බොහෝ දෙනෙක් සිංහල පමණක් යන ධජය යටතේ දෙමළ විරෝධී ව්‍යාපාරය කට මැදහත් වෙමින් රක්ෂා නැතිකම ආදී තම ආර්ථික ප්‍රශ්න විසඳීමට තැත් කළහ.

ජාතිවාදය දියුණුවීමට ආර්ථික ප්‍රශ්න නොවිසඳී තිබීම බලවත් හේතුවක්වූ බවට පහත සඳහන් කරුණුද - සාක්ෂියකි. කම්කරු පංති සටනත්, ජාතිභේද සටනත් පරස්පර විරෝධිවූ ක්‍රියා පිළිවෙලවල් දෙ කකි. එහෙත් 1950 ජූනි මාසයේ ඇතිවූ සුළු කෝලාහල වලින් වත් 1958 මැයිවල ඇතිවූ මහා කෝලාහල වලින් වත් කම්කරු පංති ව්‍යාපා රය කිසිසේත් දුර්වලවූ බවක් පෙනෙන්නට නැත. ජනතාවගේ පංති සටනට පමණක් නොව ජාතිවාදීන්ගේ ජාතිවාදී සටනටද ආර්ථික පීඩ නය ශක්තියක් ගෙන දෙන්නක් බව මෙයින් පැහැදිළි නොවන්නේද? ලංකාවේ වෙසෙන නා නා කොටස් වල ජාතිවාදය සහ ඔවුන් අතර

භේදය අතුරුදහන් කළ හැකි වන්නේ සමාජයේ මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමෙන් පමණකි. එක්සත් ලංකාවක් ඇති කිරීමේ කර්තව්‍යය මෙන්ම ඉහතකී කර්තව්‍යයන් ඉටුකළ හැක්කේ කම්කරු පංතියටත්, ලංකා සමසමාජ පක්ෂයටත් පමණක් බව කිව යුතු නොවේ.

ජනතාවගේ තියම ප්‍රශ්න නොවිසඳන ආණ්ඩුව ජනතා කල කිරී මෙන් බේරීම සඳහා ජාති, ආගම්භේද අවුස්සා රටට කුමක් වුවත් තම තත්ත්වය ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කරන ආකාරය ගැන එමට නිදසුන් ඇත. මීට පෙර පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මෙන්ම, ජනතා ප්‍රශ්න විසඳීමට අසමත්වූ මහජන එක්සත් පෙරමුණේ ආංඩුව එම මාර්ගයේම ගමන් කරමින් සිටින බව පෙනෙන්නට තිබේ.

## ඉන්දියානු ප්‍රශ්නය

භාෂාව දඩමීමා කර ගනිමින් ඇම්. ඊ. පී. ආණ්ඩුව සිංහල ජනයා මුලා කළ අන්දම අද ප්‍රකටය. ඉදිරියට ඔවුන්ට එම ආයුධය පාවිච්චි කරමින් ජනයා මුලා කිරීමට බැරි වෙතත් වෙනත් අන්දම් වලින් ජාති, ආගම්, භේද ඇවිස්සීමට ඉඩ ඇති බැව් සැලකිය යුතුය. විශෙෂයෙන් යූ. ඇන්. පිය විසින් වමට පහර ගැසීමට පාවිච්චි කරනු ලැබූ ඉන්දියානු ප්‍රශ්නයද ඔවුන් විසින් යෙදිය හැක. එහෙත්, මේ ප්‍රශ්නය ගැන සෑම වර්ගයකම සිංහල ජාති වාදීන් මහජනයා මුලා කිරීමට යොදා ගනු ලබන වනූ ගුංඩුවක් ලෙස ප්‍රයෝජනයට ගන්නා නමුදු ඒ පිළිබඳ ඇත්ත තත්ත්වය හෙළි කිරීමට මැළිවෙති. මේ ප්‍රශ්නය පිළිබඳ ඇත්ත තත්ත්වය කුමක්ද?

19 වෙනි ශත වර්ශයේ දෙවැනි භාගයේ සිට 1948 දක්වා ඉන්දියා වෙන් ගෙනා කම්කරුවන් සහ ඔවුන්ගේ දරු පවුල් හත් ලක්ෂයක් පමණ ලංකාවේ වතුවල සිටී. අද මොවුන්ගෙන් වැඩි පිරිසක් ලංකාවේම උපන් අය වෙති. මොවුන් ගෙන් සුළු කොටසක් ඉන්දියානු හා පකිස්ථානු පුර වැසි පනත යටතේ ලාංකික පුරවැසියන්වී සිටින අතර එමෙන්ම සුළු පිරිසක්ද ඉන්දියානු පුරවැසියන් ලෙස ඉන්දියානු ආණ්ඩුව භාර ගෙන තිබේ. ප්‍රශ්නය ඇතිවී තිබෙන්නේ ඉන්දියානු පුරවැසියන් ලෙස භාර නොගන්නා වූද, ලංකාණ්ඩුව ලංකා පුරවැසියන් ලෙස භාර නොගන්න වූද පන්ලක්ෂයක් පමණවූ සංඛ්‍යාව ගැනයි.

මේ අය ගැන සිංහල ජාතිවාදීන් අදහස් කරන්නේ කුමක්ද? ඔවුන් සියළු දෙනාම ඉන්දියාවට යැවිය යුතු යයි කෑ ගැසීම පහසු දෙයකි. එහෙත් ඇත්ත තත්ත්වය නම් තමන්ගේ පුර වැසියන් මිස අන් අය භාර ගැනීමට ඉන්දියානු ආණ්ඩුව සූදානම් නොවීමය. එසේනම්, මේ අය පිළිබඳව සිංහල ජාතීවාදීන්ගේ යෝජනාව කුමක්ද? ඔවුන් මුහුදට දැමීමද?

නොඑසේනම්, ජර්මනියේ හිට්ලර් යුදෙව්වනට කළාක් මෙන් ඔවුන් ස්ත්‍රී, පුරුෂ, ළමා ලපටින් සියළු දෙනාම විස වායුව පිරුණු කාමරවල දමා අමු අමුවේ මරා දැමීමද? මේ ප්‍රශ්නවලට අපට පිළිතුරු නොලැබෙනවා ඇත. මක්නිසාදයත්, ජාති භේද්‍ය අවුස්සන්නන්ගේ අදහස් ප්‍රශ්නය විසඳීම නොව ජාති භෙදය අවුස්සා චන්දය ලබා ගැනීම වන හෙයිනි.

එහෙත් ඒ අතර තුරදී මේ කම්කරුවන් සහ ඔවුන්ගේ දරු පවුල් කිසිම දේශපාලන අයිතිවාසිකමක් නොමැති පිරිසක් ලෙස මේ රටේ වෙසෙති. වැඩ කරති. ඉදිරියටත් එසේ සිටිනවා ඇත. මෙවැනි අයිතිවාසිකම් රහිත පිරිසක් මෙරටේ කම්කරු පංතිය අතර සිටීම මුලු කම්කරු පංති ව්‍යාපාරයටම මහත් නින්දුවක් හා දුබලකමක්ද වන අතර එය මුලු රටටම අනාගතයේදී මහත් දුර්වල කමක් හා අනතුරක් විය හැකි බැව් වටහා ගත යුතුය.

මේ ප්‍රශ්නය පිළිබඳව ඇතිවිය හැකි එකම විසඳීම වනුයේ ලංකාව සිය ජන්ම භූමිය ලෙස ඇත්ත වශයෙන් සැලකීමට සූදානම් එවැනි සියලු දෙනාම ලාංකිකයන් කොට භාර ගෙන ක්‍රියා කිරීමය. මෙය යුක්ති ගරුකවූ එකම ක්‍රියාව පමණක් නොව මෙරටට පක්ෂපාත කම ඇති ලාංකික පිරිසක් එක්සත් ලංකාවක් තුළ ඇති කිරීමේ එකම මාර්ගය වේ.

ඇත්තෙන්ම, කිසිම අයිතිවාසිකමක් නොමැති කොටසක් ඉතිරි වීමට ඉඩ නොතබමින් ලංකා ඉන්දියානුන් සියළු දෙනාම ලංකා පුර වැසියන් හෝ ඉන්දියානු පුර වැසියන් හෝ කිරීමේ ප්‍රතිපත්තිය යූ. ඇන්. පී. ආණ්ඩුව අනුගමනය කෙළේ නම් මෙම 5 න් ලක්ෂයෙන් සැහෙන කොටසක් ඉන්දියාවේ ආණ්ඩුව විසින් ඉන්දියානු පුර වැසියන් ලෙස භාර ගනු සැක නැත.

19 වැනි වර්ෂයේදී ඉන්දියාවේ ආණ්ඩුවත් සමග ඩඩ්ලි සේනානායක මහතා ඇති කළ සාකච්ඡාව කඩා වැටුනේ 50 ක් දහක පුරවැසි භාවයේ ප්‍රශ්නය උඩ බැව් ප්‍රකටය. ලංකාණ්ඩුව මේ ප්‍රශ්නය උඩ අනුගමනය කර තිබෙන ප්‍රතිපත්තිය උඩ ලංකාවට කිසිම වාසියක් ඇතිවී තිබේ යැයි කිසිවෙකුට පෙන්විය නොහැක. මේ ප්‍රශ්නය ගැන බේරුමක් නොකිරී මෙන් වාසියක් ඇති වන්නේ ලංකාවේ ධනපති පංතියටය. කම්කරු පංති ව්‍යාපාරයට විරුඬව දේශපාලන ආයුධයක් ලෙස පාවිච්චි කළ හැකි මේ ප්‍රශ්නය යූ. ඇන්. පී. ආණ්ඩුව විසින් නොවිසඳා තබා ගෙන සිටීම පුදුමයක් නොවේ. එහෙත් ඇම්. ඊ. පී. ආණ්ඩුවත් වර්ෂ 2 ක් මුලුල්ලේ මේ ප්‍රශ්නය ගැන කිසිවක් නොකිරී මෙන් පෙනී යන්නේ ඔවුන්ද මේ ප්‍රශ්නය ගැන යූ. ඇන්. පී. මාර්ගයම අනුගමනය කිරීමට බලාපොරොත්තු වන බවයි.

# ලංකාව සිංහල රජයක් කිරීමේ මතය

සිංහල පමණක් රජයේ භාෂාව විය යුතු යයි පවසන සිංහල ජාතිවාදීන් ඉදිරිපත් කරන එක්තරා තර්කයකට මෙතැන්හිදී පිළිතුරු දීමට සුදුසුය. රටේ ප්‍රගතිය සඳහා මෙරට වෙසෙන සෑම වර්ගයාම එක් ජාතියක් වශයෙන් ගොඩ නැඟීම අවශ්‍ය බැව් පිළිගන්නා මොව්හු එම ජාතිය සිංහල ජාතිය විය යුතු යයි පවසති. ඇතැම්විට ලාංකික ජාතිය යන වචනය ඔවුන් භාවිතා කරනත් ඔවුන් අදහස් කරන්නේ සිංහල භාෂාව කථා කරන, සිංහල සිරිත්, විරිත් භාවිතා කරන, කොටින් කියතොත් සිංහල සංස්කෘතිය අනුවම හැඩ ගැසුණු ජාතියකි. සුළු ජාතික හා ආගමික කොටස් කිහිපයක්ම ලංකාවේ වෙසෙන බැවින් ඉහතකී අන්දමේ විසඳීමක් එම සුළු ජාතීන්ගේ කැමැත්ත උඩ මිස ඇති කළ නොහැකි බැව්ද අද එවැනි තත්ත්වයක් පිළිගැනීමට සුළු ජාතීන් සූදානම් නැති බැව්ද, අප පවසන විට සිංහල ජාතිවාදීන්ගේ පිළිතුර වන්නේ කුමක්ද?

බ්‍රිතාන්‍යයේ වෙසෙන ඉංග්‍රීසි, "ස්කොට්" හා "වේල්ස්" යන ජාතීන් එක් බ්‍රිතාන්‍ය ජාතියක් ලෙස හැඩ ගැසුනේ වැඩි කොටසවූ ඉංග්‍රීසින්ගේ භාෂාවත්, ශිෂ්ඨාචාරයත් පිළිගැනීමෙන් බව ඔව්හු කියති. එහෙත්, මෙය සිදුවූයේ කෙසේදැයි මෙසේ කතා කරන්නවුන් දන්නේද? ඉංග්‍රීසි ජාතිය බ්‍රිතාන්‍යයේ වෙසෙන සුළු ජාතීන්ට, ඉංග්‍රීසි භාෂාවත්, ශිෂ්ඨාචාරයත්, රජවරුනුත් පිළිගන්වනු ලැබුයේ ශත වර්ෂ ගණනාවක් මුලුල්ලේ කළ යුධ වල සාර්ථක ප්‍රතිඵල වශයෙනි. ඒ නැතහොත්, එරට වෙසෙන සුළු ජාතීන් යට කිරීමෙනි. ලංකාවේ වෙසෙන සුළු ජාතීන් පිළිබඳව මහා ජාතිය වූ සිංහලයන් මෙසේ ක්‍රියා කළ යුතුය යයි සිංහල ජාතිවාදීන් යෝජනා කරන්නේද? ඇත්තෙන්ම, මොවුන් ගෙන් කීප දෙනෙක් එවැනි අදහස් දරණ බව ඔවුන්ගේ ප්‍රකාශයන්ගෙන් පෙනෙන්නට තිබේ. එහෙත්, නිර්භීත සිංහල වීරයින් ලෙස අද මෙසේ ඉදිරිපත් වෙන අය ගෙන් කී දෙනෙක්, සුළු ජාතීන් සමග සිංහල ජාතිය, බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය වාදීන්ගේ වහල් බැම්වලට හසුව සිටි අවධියේදී ඊට විරුද්ධව ශබ්දයක්වත් නැගුවේදැයි සිහි කිරීම වටී. කෙසේ වෙතත් බ්‍රිතාන්‍යය වැනි රටවල් බටහිර ජාතීන් වශයෙන් හැඩ ගැසුණු යුගයත් අප ජීවත් වෙන වර්තමාන යුගයත් අතර ශත වර්ෂ ගණනාවක් තිබෙන බව කිව යුතුය. රදළ යුගය, ධන පති යුගයට පෙරළීමට පටන් ගත් සමයේදී නූතන රජය තුළ සවිංධානය වූ ජාතිය හැඩ ගැසුනේ බොහෝ විට මහා ජාතියට එම රාජ්‍යය තුළ සිටි සුළු ජාතීන් යටත් වීමෙන් බව නම් සත්‍යයකි.

## 20 වන ශත වර්ෂයේ අමුතු ලක්ෂණ දෙකක්

එහෙත්, විසිවෙනි ශත වර්ෂයේ නූතන රජය හැඩ ගැසෙන විට එය මහා ජාතිය විසින් සුළු ජාතිය යටත් කර ගැනීමෙන් කළ හැක්කක් නොවේ. ඊට විශෙෂ හේතූන් දෙකක් පෙර ශත වර්ෂයක ජීවත් වෙන සිංහල ජාතිවාදීන්ට පෙන්වා දීමට කැමැත්තෙමි. ප්‍රථමයෙන්, අද ලෝකයේ කොයි රටක වුවත් සාමාන්‍ය ජනයා රදළ සමයේ සාමාන්‍ය ජනයා මෙන් නොව යම් යම් හැඟීම් වලින් අවදිවී සිටින ජනකායකි. නා නා වර්ගයන් හෙවත් ජාතීන් වෙසෙන රටක් තිබේද, මහා වර්ගයට හෙවත් මහා ජාතියට පමණක් නොව එහි ඇති සුළු ජාතික කොටස් වලටද සිය භාෂාව, සංස්කෘතිය ආදිය ගැන තද ඇල්මක් තිබේ. රදළ සමයේදී සුළු ජාතියක අයිතිවාසිකම් රැකීමට සිටියේ ඇතැම් විට එම ප්‍රදේශයේ රජේක් හා රදළවරුන් අතලොස්සකි. එබැවින් ඒ කාලයේදී මහා ජාතියක් විසින් සුළු ජාතියක් හෝ ජාතීන් ගණනක් යට කිරීම පහසු කටයුත්තක් විය. වර්තමාන යුගයේ එය පෙරට වඩා බොහෝ දුෂ්කර කටයුත්තක් වනු පමණක් නොව මහා ජාතියක් විසින් එසේ කිරීමෙන් සිදු වන්නේ සුළු ජාතිය හෝ ජාතීන් වෙනම ජාතියක් වශයෙන් වෙනම රජයක් තුළ හැඩ ගැසීමට තැත් කිරීමය.

දෙවනුව වර්තමාන යුගය වනාහි අධිරාජ්‍ය යෝධයන් ලොව පුරා සිය බලය පාන යුගයකි. යම්කිසි බලවත් නොවූ නොදියුණු රටක, මහා ජාතිය ඒ රටේ වෙසෙන සුළු ජාතීන් යට කිරීම සඳහා සටනක යෙදෙන්නේ නම් එය එසේ වැඩි කලක් කර ගෙන යාමට පෙර බලවත් අධිරාජ්‍ය රටක් මැදිහත් වී සාමයේ නාමයෙන් තමන්ගේ වාසියට මහා ජාතිය ඇතුලු සියලු දෙනාම සිය ගොදුරට ගැනීම වැළැක්විය නොහැක්කකි.

ඉහතකී කරුණු දෙක නිසා සිංහල ජාතිවාදීන් වග කීමෙන් තොරව මෙරටට පෙන්වන මාවත ලාංකික ජාතියත් සිංහල ජාතියත්, රටේ සවාධීනත්වයත් විනාශ මුඛයට ඇද දමන මාවතකි.

ඇතැම් සිංහල ජාතිවාදීන් තමන්ගේ මතයට ප්‍රගතිශීලී සායමක් දැමීමට කොපමණ තැත් කළත් මෙම යුගයේදී ඔවුන්ගේ මතය සැම අතින්ම ප්‍රතිගාමී මතයක් ලෙස හෙළා දැකීමට සිදුවේ.

## ජාතීන් එක්සත් කළ හැකි මග

එහෙත්, වර්තමාන යුගයේ නූතන රජය තුළ එහි වෙසෙන නා නා ජාතීන් එක්සත් කිරීමේ මාවතක් තිබේ. නැගෙනහිර යුරෝපයේ රට වල්ද තරමක් දුරට ඉන්දියාවද ඊට නිදසුන් වෙත්. ඒ මාවත වනාහි සකල ජාතීන්ගේ භාෂා හා සංස්කෘතික අයිතිවාසිකම් රැක දෙමින් ඔවුන් සතුටින්ම එක්සත් කිරීමේ මාවත වේ. සුළු ජාතීන්ගේ භාෂාව හා සංස්

කෘතිය යටවන අයුරු ක්‍රියා කරනු වෙනුවට මහ ජාතිය විසින් සුළු ජාතීන්ගේ විශ්වාසය හා සහාය දිනා ගැනීම සඳහා ඔවුන්ගේ භාෂාව හා සංස්කෘතියට මහ ජාතියේ භාෂාව හා සංස්කෘතියට දෙවැනි නොවන තැනක් රජය තුළ දෙනු ලැබේ. මේ වනාහි නූතන යුගයෙහි එක් රාජ්‍යයක් තුළ ජාතීන් කීපයක් එක්සත් කළ හැකි එකම මාර්ගය වේ.

ඉහතකී ප්‍රතිපත්තිය අනුව ලංකාවේද ක්‍රියා කරණු ලබන්නේ නම් සිංහල භාෂාව හා සංස්කෘතිය දියුණු කිරීමට සෑම ඉඩ අවස්ථාවක් ඇති වන අතර මේ රටේ පුර වැසියන් වන දෙමළ අයටද කිසිම වෙනසක් නැතුව තම භාෂාව හා ශිෂ්ඨාචාරය දියුණු කිරීමට එමෙන්ම ඉඩ කඩ ලැබෙනවා ඇත. රාජ්‍ය භාෂා විෂයෙහි සිංහල පමණක් රජයේ භාෂාව කිරීමෙන් ඉහතකී දේ සිදු නොවේ. සිංහල සහ දෙමළ යන භාෂා දෙකටම රාජ්‍යය භාෂා තත්ත්වයක් තිබිය යුතුයි. බොහෝ සෙයින්ම වැඩි කොටස වූ සිංහලයන්ගේ භාෂාව රජයේ කටයුතු වලදී ඉතා වැඩි වශයෙන් පාවිච්චි වන බවට සැක නැත. කොයි කොයි අවස්ථාවලදී කොයි කොයි භාෂාවක් පාවිච්චි කරනු ලබන්නේද යන්න මහ ජනයාගේ පහසුකම සලකාමින් ක්‍රියා කරනු ඇත. කෙසේ වෙතත් ඉහතකී ප්‍රශ්නය සතුටුදායක අන්දමකට නිරාකරණය විය හැක්කේ නිලධාරී පිරිසක් විසින් කාර්යාලයක සිට සකස් කරනු ලබන අණ පනත් වලින් නොව අත්හදා බැලීමෙන් පමණකි. තවද සිංහල සහ දෙමළ යන භාෂා දෙකින් එකක් තේරීමට සිදුවන අවස්ථාවලදී එසේ තේරෙණු ඇත්තේ වැඩි දෙනාගේ භාෂාව වන සිංහල බව කිව යුතු නොවේ. එහෙත් වැදගත් කාරණාව වනුයේ දෙමළ අයට රජය සමග තම භාෂාවෙන් ගනු දෙනු කර ගැණීමට සිංහලයන්ට මෙන්ම අයිතිවාසිකම තිබීම වේ. සිංහල සහ දෙමළ භාෂා වලට සම තැන තිබිය යුතුය යන ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රතිපත්තියේ තේරුම මෙයයි. සමතැන යන වචනයෙන් වැරදි අදහසක් ඇතිවන්නේ නම් එම වචනය අස් කොට එයින් අදහස් කරන දේ කෙරෙහි සිත් යොමු කරන ලෙස අප පක්ෂයේ කථිකයන් එක වරක් නොව කීප වරක් ඉල්ලා තිබේ. රටට අවශ්‍ය වී ඇත්තේ වචනයක් ගැන වාද විවාද කිරීම නොව අඛණ්ඩ ලංකාවක් ගොඩ නැගීම සඳහා මහ ජාතිය විසින් සුළු ජාතීන්ගේ විශ්වාශය හා සහාය ලැබෙන අයුරු ක්‍රියා කිරීම වේ.

“සිංහල පමණක්” යන ප්‍රතිපත්තියෙන් සිදුවී ඇත්තේ මහා ජාතිය කෙරෙහි සුළු ජාතීන්ගේ විශ්වාසයට මරු පහරක් වැදීම පමණක් නොව ඉංග්‍රීසි භාෂාවෙන් රටේ පාලනය ගෙන යෑම කරණ කොට ගෙන මහ ජනයාට ඇති හිරිහැර අහෝසි කිරීම තවත් පමා වීමකි. පළල් මහ ජනයාට ඇත්ත වශයෙන් වුවමනා කරන්නේ නොතේරෙන ඉංග්‍රීසි භාෂාවෙන් නොව තමන්ට තේරෙන භාෂාවෙන් රටේ පාලනය ගෙන යෑමය. සිංහල ජනයාගේ පහසුකම සඳහා එමෙන්ම දෙමළ ජනයාගේ පහසුකම

සඳහාද මේ කටයුත්ත ඉටුකර දෙනු වෙනුවට "සිංහල පමණක්" යන ප්‍රතිපත්තියෙන් හටගත් සන්ධු දබර නිසා මේ පරිවර්තනය තවත් කල් ගොස් රජයේ පාලන කටයුතුවල ඉංග්‍රීසි භාෂාව මූලිකස්ථානය දරණ බව පෙනෙන්ට තිබේ.

## දෙමළ භාෂා පණත

නොබෝද සම්මත කර ගන්නා ලද දෙමළ භාෂා පණතද රාජ්‍ය භාෂා දෙකක් තිබිය යුතු යන ප්‍රතිපත්තියේ සත්‍යතාවය පෙන්වන්නකි. ඉහතකී පණතෙන් සිංහල පමණක් යන භාෂා ප්‍රතිපත්තිය බිඳ වැටී සිංහල භාෂා පණත සංශෝධණය විය. තමට පමණක් සිංහල එකම රජයේ භාෂාව වන්නේයයි කීමෙන් ආණ්ඩු පක්ෂය රැවටීමට බලාපොරොත්තු වන්නේ කව්රුන් දැයි පැහැදිලි නැත. එම දෙමළ භාෂා පණතෙන් පසුව සීමිත අන්දමකට වුවද දෙමළ භාෂාව පැහැදිලිවම නීති ගත රජයේ භාෂාවක් වී තිබේ.

මෙයින් අප විසින් අදහස් කරනු ලබන්නේ දෙමළ භාෂා පණතෙන් පසුව භාෂා ප්‍රශ්ණය විසඳුනේය යන්න නොවේ. එම පණතේ ප්‍රධාන විශාල අඩු පාඩු දෙකක් තිබේ. ප්‍රථම කොට, ක්‍රියාවෙන් එය සිදුවී ඇතත් වචනයෙන් දෙමළ භාෂාව රාජ්‍ය භාෂාවක් ලෙස නම් නොකිරීම දෙමළ සුළු ජාතියට කරන නුවූවමණා නිග්‍රහයකි. දෙවනුව, දෙමළ භාෂාව රාජ්‍ය භාෂාවක් වී ඇත්තේ සාමාන්‍යයෙන් උතුරු සහ නැගෙනහිර ප්‍රාන්ත වලට පමණක් යයි කිව හැක. සිංහල සහ දෙමළ ජනයා සිටින කොළඹ වැනි මිශ්‍ර පෙදෙස්වල ආංඩුව සමග තම ගනු දෙනු දෙමළ භාෂාවෙන් කිරීමේ අයිතිවාසි කම දෙමළ ජනයාට නොතිබීම අයුක්තියකි.

අවසාන වශයෙන්, තමන්ගේ භාෂාව රාජ්‍ය භාෂා තත්ත්වයට පමුණුවීම රටක මහ ජාතියට වැදගත් කටයුත්තක් වන්නේ නම්, එය සුළු ජාතියකට ඊටත් වඩා වැදගත් කටයුත්තක් සේ ඔවුන්ට පෙනෙන බව සිහි කළ යුතුයි. මහ ජාතිය සුළු ජාතියේ භාෂා අයිතිවාසිකම සතුටින් දෙන්නේ නම් එයින් රාෂ්ට්‍රයට අවශ්‍ය සමගිය ඇතිවනු පමණක් නොව කල් යෑමේදී සුළු ජාතිය මහ ජාතියේ භාෂාව භාර ගෙන එය ඇතැම් විට තමන්ගේ භාෂාවටත් වඩා භාවිතා කිරීමට පටන් ගන්නේය. මීට ලෝකයේ ඇති නිදසුන් කීපයකින් එකක් මතක් කරමු.

බටහිර යුරෝපයේ පිහිටි බෙල්ජියම ලංකාව මෙන්ම කුඩා රටකි. එහිද භාෂා දෙකක් කථා කරන ජනකායක් සිටී. එම භාෂා දෙක ප්‍රංශ සහ ප්ලෙමිෂ් යන භාෂා දෙක වේ. මේ භාෂාවන් දෙකම රාජ්‍ය භාෂාවන් වේ. එහෙත් වැඩි වශයෙන් භාවිතාවූ ප්‍රංශ භාෂාව වඩ වඩා භාවිතාවී මෙන් අද ප්ලෙමිෂ් අය ඇතුලු සියලු දෙනාම සිය කටයුතු කරන්නේත්

ප්‍රංශ භාෂාවෙන්ය. එහෙත් අද වුවද ප්‍රංශ භාෂාව රජයේ එකම භාෂාව ලෙස නීති ගත කිරීමට තැතක් දරන්නේ නම් ප්ලෙමිෂ් ජාතිකයන් එකහෙලාම කැරලි ගසනවා ඇත. මෙයින් ලංකාවේ අපට උගත යුතු පාඩමක් තිබෙනවා නොවෙද?

## රට එක්සත් කළ හැක්කේ කාටද?

මෙරට වෙසෙන වැඩි කොටස වන සිංහල ජනයා සහ සෙසු ජාතීන් අඛණ්ඩ ලංකාවක් තුල එක්සත් කිරීමේ අපේක්ෂාව ඇත්තේත් එය ඉටු කල හැක්කේත් ධනපති පංතියට හෝ එහි පක්ෂවලට නොව කම්කරු පංතියටත් එහි පක්ෂය වන ලංකා සමසමාජ පක්ෂයටත් බව අපි කලින් සඳහන් කෙළෙමු. එමෙන්ම ජාති භේදයට ප්‍රධාන උල්පතක්වූ රක්ෂා නැති කම ප්‍රධානතම ආර්ථික පීඩණය අතුරු දහන් කිරීමේ මාවතේ රට ගමන් කරවිය හැක්කේත් කම්කරු පංතියටත් ලංකා සමසමාජ පක්ෂයටත් පමණකි.

වර්ෂ 23 ක කාලය මුළුල්ලේ මෙරට පීඩිත ජනතාව වෙනුවෙන් වැඩ කළ, සටන් කළ, නොයෙක් අන්දමේ වධ බන්ධන වලට ලක්වූ ලංකා සමසමාජ පක්ෂයේ පරමාර්ථය අන් කිසිවක් නොව පීඩිත ජනතාවගේ විමුක්තිය බැව් යලින් වරක් භාෂා ප්‍රශ්ණයේදී ලොවට පෙන්වා දී තිබේ. අන් පක්ෂ මහ ජනයාගේ තාවකාලික ප්‍රසාදය ලබා ගැණීමේ අපියෙන් මහ ජනයාව බොරු වලින් රවටා මේ රට විනාශයේ මුඛයට පත් කළ විට, ලංකා සමසමාජ පක්ෂය මහ ජනයාට ඇත්ත ප්‍රකාශ කොට ගල් මුල් පහරවලට පවා මුහුණ දුන්නේ එහි අරමුණ රට වැනසුනත් ඇමති පුටු රත් කිරීම නොවන නිසාය. මේවා කල්පනා කරන කාහටවුවත් පැහැදිලි වන කරුණුය. එබැවින් රට එක්සත් කිරීමටත් රක්ෂා නැති කම, බඩු මිල ඉහල යෑම ආදී ආර්ථික ප්‍රශ්න විසඳීමටත් මාර්ගය පෙන්වන එකම පක්ෂය වන ලංකා සමසමාජ පක්ෂයේ නිවැරදි ක්‍රියා මාර්ගය අනුව, ඉදිරියට ඒමට රට වැසි ජනතාවට දැන් කාලය පැමිණ තිබේ.

★

"නුදුරු අනාගතයේදී මේ රටේ මහජනයා විසින් මේ ආංඩුව තල්ලු කර දමනවා ඇත."

— **රොබට් ගුණවර්ධන**

**දූෂිත ආංඩුවක් පෙරළීම සඳහා**

මෑත අතීතයේදී රුසියන් කම්කරු පංතිය, අතට ගත් අවි ඇතිව එරට දූෂිත ආංඩුව පෙරලා දමා කම්කරු රජයක් පිහිටුවා ගත් ඒ අභිමානවත් ඓතිහාසික ප්‍රවෘත්තිය දැන ගැනීමට පහත සඳහන් පොත් දෙක කියවන්න.

## රුසියන් විප්ලවය

ක. තී.

**ලෙස්ලි ගුණවර්ධන**

**මිල 1. 25 යි**

## ආයුධ සන්නද්ධ නැගිටීම

ක. තී.

**ලියොන් ට්‍රොට්ස්කි**

**මිල ශත 25 යි**

'ස්ටාර්' යන්ත්‍රාලය - මරදාන.